# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1717/17 - 2011 අගෝස්තු 03 වැනි බදාදා - 2011.08.03**

(රජයේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: දො/ඉ/1/අත්/අධි/88.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර :

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පහන්වත්ත ගමේ, මැනුම්පති විසින් පිළියෙල කර ඇති අංක ක 4234 සහ 2010.07.20 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 1 සිට 3 වශයෙන් පෙන්නුම් කෙරෙන මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0461 ක් වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි තුන (3).

1. කැබලි අංක 1
ඉඩමේ නම: පහන්වත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කේ. කේ. ඩී. කේ. රණවීර, ඇලදූවවත්ත,මතුගම; ප්‍රමාණය: හෙක්. 0.0202.

2. කැබලි අංක 2
ඉඩමේ නම: පහන්වත්ත; විස්තරය: කුඹුර; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩබ්. ඩී. එස්. එල් ද මෙල්,නො.144/1, කොටගෙදර පාර,මඩපාත,පිළියන්දල; ප්‍රමාණය: හෙක්. 0.0139.

3. කැබලි අංක 3
ඉඩමේ නම: පහන්වත්ත; විස්තරය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කිට්නන් සෙල්වදොරේ, ඇලදූව, මතුගම; ප්‍රමාණය: හෙක්. 0.0120.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලි වලින් බලය ලත් අයවලුන් හෝ 2011 ඔක්තෝබර් මස 10 වැනි දින පූ.භා 10.00 ට දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද 2011 ඔක්තෝබර් මස 03 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. ඩබ්.ටී. ආර්. වෙත්තසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
දොඩන්ගොඩ.

2011 ජූලි මස 26 වැනි දින,
දොඩන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී.

08-481

---

### ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: නව/ඉ/1/ 1/9/එල්ඒ/ 4516.
ඉඩම් අමාත්‍යාංශ ලේකම් ගේ අංකය: 3/ජේ/82/අයිආර්/219.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 7 වැනි වගන්තිය යටතේ අංක 1269/1 හා 2002.12.30 වෙනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද අංක අ. ග. පි. 3219 පිඹුරේ සදහන් අංක 266 සහ 268 දරන ඉඩම් කොටස් දෙකෙහි ආර්. එච්. එම්. සුමනාවතී යනුවෙන් මුද්‍රණය වූ අයිතිකරුගේ නම ආර්. එච්. එම්. පුංචිබණ්ඩා ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

ඩබ්ලිව්. එල්. ඩී. එන්. කුමාර,
ප්‍රාදේශීය ලේකම්,
නවගත්තේගම.

2011 ජූලි මස 28 වැනි දින,
නවගත්තේගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 482


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.